# ලංසු ආරාධනයයි (IFB)

## මහජන ආරක්ෂක අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා පොලීසිය

### ශ්‍රී ලංකා පොලීසිය සඳහා හම් සපත්තු ජෝඩු 70,000 ක් (Leather Shoes) ප්‍රසම්පාදනය

**ලංසු අංකය : *MPS/03/PB/PR/07/08/2024***

01. සභාපති, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද **ප්‍රසම්පාදන කමිටුව, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව** විසින් **ශ්‍රී ලංකා පොලීසිය සඳහා හම් සපත්තු ජෝඩු 70,000 ක් ප්‍රසම්පාදනය** සඳහා සුදුසුකම්ලත් හා අවශ්‍යතා සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදු කරනු ලබයි.

03. ප්‍රසම්පාදන උපලේඛනය

| ප්‍රසම්පාදනයේ නම | ලංසු ඇපකරයේ වටිනාකම | ආපසු නොගෙවන ලිපි ලේඛන ගාස්තුව | ලංසු භාර ගැනීමේ අවසාන දිනය | පූර්ව ලංසු රැස්වීම |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පොලීසිය සඳහා හම් සපත්තු ජෝඩු 70,000 ක් (Leather Shoes) ප්‍රසම්පාදනය | රු. 9,327,950.00 | රු. 69,750.00 | 2024.07.23 දින පැය 14.00 | 2024.07.08 දින පැය 10.30 ට ශ්‍රවණාගාරය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව දී පැවැත් වේ. |

04. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් හට වැඩි විස්තර, ප්‍රධාන ගණකාධිකාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, වෙතින් දුරකථන අංක: 0112 887697 / විද්‍යුත් ලිපිනය: mops.procurementunit@gmail.com මගින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී **2024.07.02 දින සිට 2024.07.22 වන දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00** අතර කාලයේ දී **මූල්‍ය අංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල** හිදී හෝ අපගේ නිල වෙබ් අඩවියෙන් (www.pubsec.gov.lk) ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කල හැකිය.

05. ප්‍රධාන ගණකාධිකාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත්කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන **රුපියල් හැට නව දහස් හත්සිය පනහක (රු.69,750.00)** ලංසු පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් **2024.07.02 දින සිට 2024.07.22 වන දින** දක්වා රජයේ වැඩ කරන දිනයන්හි **පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා** කාලය තුළ ලබාගත හැක.

06. ඉදිරිපත් කරනු ලබන ලංසුවල වලංගු කාලය **2024.11.18** දක්වා විය යුතුය. සියලුම ලංසු, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිකුත් කළ, **2024.12.17 දින** දක්වා **වලංගු රුපියල් අනූතුන් ලක්ෂ විසි හත් දහස් නවසියපනහක (රු.9,327,950.00) ඇපකරයක්** සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසුව **2024.07.23** දින **ප.ව 2.00 ට හෝ ඊට පෙර** මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, වෙත ලැබිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසාන වූ වහාම එම අවස්ථාවට සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව,**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය,**
**17 වන මහල, බත්තරමුල්ල,**
**ශ්‍රී ලංකාව.**

SELACINE